# සුරක්ෂිත අයිරා සහ සුරක්ෂිත ණය පහසුකම් සඳහා පොදු නීතිරීති සහ කොන්දේසි

HSBC

Should you require a translated copy of this document in Sinhala or Tamil languages, please visit www.hsbc.lk or request it from any one of our branches.

මෙම ලේඛනයේ ඉංග්‍රිසි හෝ දමිළ භාෂා පරිවර්තනයක පිටපතක් ඔබට අවශ්‍ය වේ නම්, කරුණාකර අපගේ නිල පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න, නැතිනම් අපගේ ඕනෑම ශාඛාවකින් ඉල්ලා සිටින්න.

இந்த ஆவணத்தின் ஆங்கில மற்றும் சிங்கள மொழிபெயர்ப்பு தேவைப்படின் தயவுசெய்து www.hsbc.lk என்ற எமது இணையத்தளத்தை நாடவும் அல்லது எமது கிளை ஒன்றில் கேட்டுப் பெறவும.

**නීතිරීති සහ කොන්දේසි**

දමින් මතුවට 'බැංකුව' යනුවෙනු හැඳින්වෙනු ඇති ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් විසින් (ණය ගැණුම්කරු/කරුවන් ලෙස හැඳින්වෙනු ඇති) මා / අප වෙත අයිරාවක ආකාරයෙන් හෝ වාරික ණයක ආකාරයෙන් මාගේ / අපගේ සමස්ත රුපියල් කාල තැන්පතු ගිණුම(ගිණුම්)වල වටිනාකමින් 90%ක් සහ/හෝ මාගේ/අපගේ විදේශ විනිමය කාල තැන්පතු ගිණුම (ගිණුම්)වල වටිනාකමින් 80% ක් නොඉක්මවන මුදලක් සඳහා ස්මාට් මනී පහසුකම ලබාදීමට ඉදිරිපත්වීම සලකා, (මෙම සන්දර්භය තුළ 'ණය ගැණුම්කරු' යන යෙදුම හෝ ප්‍රකාශනය මඟින් අවශ්‍ය කෙරෙන හෝ පිළිගැනෙන අවස්ථාවන් හි දී ණය ගැණුම්කරු සහ ඔහුගේ / ඇයගේ උරුමකරුවන්, පොල්මෑකරුවන් අද්මිනිස්ත්‍රාසිකරුවන් හා ලැබුම්කරුවන් අදහස් වන අතර, ඔවුන් ඇතුළත් වනු ඇති අතර, 'ණය ගැණුම්කරුවන්' යන යෙදුම ඊට අනුව අර්ථනිරූපනය කෙරෙනු ඇති අතර, අයිරා සහ වාරික ණය (මෙහි මින් මතු **"පහසුකම/පහසුකම්"** හෝ **"ස්මාර් මනී පහසුකම් ණය හෝ ස්මාට් මනී පහසුකම් අයිරාව"**යන දෙකට ම අදාළ වන පහත සඳහන් නීතිරීති සහ කොන්දේසි ණය ගැණුම්කරු/ණය ගැණුම්කරුවන් මෙමගින් භාරගෙන ඊට එකඟ ව සිටියි.

**A කොටස - පොදු**

1. ස්මාට් මනී පහසුකම ලබාගැනීමට සැලැස්වෙනු ඇත්තේ අභ්‍යන්තර බැර තහවුරු කරගැනීම සිදුවූ පසුව පමණක් බවට ණය ගැණුම්කරු/කරුවන් පිළිගනියි.

2. ණය ගැණුම්කරු/කරුවන්ගේ ජංගම හෝ ඉතුරුම් ගිණුමෙන් හර කෙරෙන සියලුම පොළී, කොමිස්, වියදම් හෝ ගාස්තු මුදල් බැංකුව වෙත පවතින ණය ගැණුම්කරු/කරුවන්ගේ වගකීමෙහි කොටසක් වනු ඇති අතර, එම මුදල් ණය ගැණුම්කරු/කරුවන්ගේ ජංගම ගිණුමෙන් හර කිරීම මගින් අයිරා සීමාව (ඉහතින් සඳහන්) හෝ බැංකුව විසින් එහි අභිමතය පරිදි නියම කර ඇති වෙනත් යම් සීමාවක් ඉක්මවීම සිදුවන්නේ නම්, එම අතිරික්ත මුදල වහාම ආපසු ගෙවීමට ණය ගැණුම්කරු/කරුවන් භාර ගනියි.

3. නිශ්චිත මුදල් හෝ ගිණුම් සම්බන්ධයෙන් කලින් කලට ලිඛිතව එකඟ වනු ඇති ආකාරයකින් හැර, මෙම/මෙකී පහසුකම/පහසුකම් පවතින කාලසීමාව තුළ ණය ගැණුම්කරු/කරුවන්ගේ ගිණුම (ගිණුම්වල) පවතින කිසියම් බැර ශේෂයක් සම්බන්ධයෙන් කිසිදු පොලියක් ණය ගැණුම්කරු/කරුවන් වෙත ගෙවිය යුතු නොවේ.

4. ගනුදෙනුකරුවන් සඳහා ස්මාට් මනී පහසුකම යටතේ ලබාදෙන අයිරා සහ වාරික ණය මත බැංකුව විසින් සිය තනි අභිමතය පරිදි තීරණය කරනු ඇති වරණීය පොලී අනුපාත බැංකුව විසින් අදාළ කරනු ලැබිය හැකිය.

5. හිඟ සියලුම මුදල් පොළී, වියදම් හා බැංකුවේ අවශ්‍යතාවලට සහ කලින් කලට බලාත්මකව පවතිනු ඇති ස්ථාවර රෙගුලාසිවලට අනුකූලව අයකෙරෙනු ඇති වෙනත් යම් ගාස්තු ද සමඟ පළමු ඉල්ලීමේදී ම ගෙවීමට ණය ගැණුම්කරු / කරුවන් මෙමඟින් භාරගෙන සිටියි. බැංකුව විසින් ප්‍රදානය කරන ලද යම් අනුග්‍රහයක් සඳහා හේතු දැක්වීමක් හෝ සාධාරණීකරණය කිරීමක් සඳහන් කිරීමකින් තොරව එවැනි පියවර ගැනීම සඳහා දින 14ක පූර්ව ලිඛිත

දැනුම්දීමක් හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නාලිකාවක්/ මාර්ගයක් මගින් ණය ගැණුම්කරු/ණය ගැණුම්කරුවන් විසින් බැංකුවට ඇති සියලු වගකීම් ගෙවා නිම කරන ලෙසට ඉල්ලා සිටීමට හා බැංකුවේ පරම අභිමතය පරිදි (මෙම ගිවිසුමේ නියම හා කොන්දේසි උල්ලංඝණය කිරීම හෝ වෙනත් යම් ආකාරයක උල්ලංඝණය වීමක් හේතුවෙන්) ණය ගැණුම්කරුට/ණය ගැණුම් කරුවන්ට ප්‍රදානය කරන ලද පහසුකම් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සඳහා සහ/හෝ ප්‍රදානය කරන ලද පහසුකම් සම්බන්ධයෙන් මුදල් ලබා ගැනීමට අවසර දීම හෝ නොදීම තීරණය කිරීමට බැංකුවට හිමිකම ඇත්තේ ය. පහසුකම / පහසුකම් අනාගත හා අභූ වගකීම් මුදලින් ආවරණය කිරීම සඳහා ඉල්ලීමට ඇති අයිතිය ද ඇතුළත්ව කොළඹ දී ඉල්ලූ විට ගෙවීම සඳහා බැංකුවේ අතික්‍රමණ අයිතියට යටත් වන බවට ණය ගැණුම්කරු/කරුවන් එකඟ වේ.

6. බැංකුව විසින් ණය ගැණුම්කරුට/ණය ගැණුම්කරුවන්ට දැණුම්දීමට අදහස් කරනු ලබන මෙකී පහසුකම් සම්බන්ධ යම් හිමිකම්පෑම්, කැඳවීම්, උපදෙස් හෝ නිවේදන බැංකුවට අවසන් වරට ණය ගැණුම්කරු/ණය ගැණුම්කරුවන් විසින් දැණුම් දුන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නාලිකාවක්/ මාර්ගයක් මගින් ණය ගැණුම්කරු/කරුවන්ගේ ඊමේල් ලිපිනයට, බැංකුව විසින් රඳවා ගෙන ඇති ලියාපදිංචි ඊමේල් ලිපිනය වෙත යථා පරිදි ලබා දී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

7. පොලී අනුපාත වෙනස්වීම පිළිබඳ නිවේදන ද ලිපි මගින් සහ/හෝ ගිණුම් ප්‍රකාශන වල පණිවුඩ මගින් සහ/හෝ බැංකුවේ ශාඛා කාර්යාල වල දැන්වීම් පුවරු වල වෙනස්වීම පිළිබඳ ප්‍රදර්ශනය කිරීම මගින් සහ/හෝ එකී වෙනස්වීම පිළිබඳ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk හි ප්‍රදර්ශනය කිරීම මගින් සහ/හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන නාලිකාවක්/ මාර්ගයක් මගින් ලබාදිය හැකිය.

8. අවසරලත් සීමාව ඉක්මවා හිඟව පවතින පහසුකම් සීමා ඉක්මවූ / හිඟ ලෙස සැලකෙනු ඇති අතර, ඒවා බැංකුවේ පවතින දඬුවම් පොලී අනුපාතවලට යටත් වනු ඇත.

9. සැකසුම් ගාස්තු, කල් තබා ආපසු ගෙවීමේ ගාස්තු, අවිධිමත් මුදල් ප්‍රමාණ ගෙවීම් සඳහා අයකිරීම් සහ හඳුන්වා දෙනු ඇති හෝ කලින් කලට සංශෝධනය කෙරෙනු ඇති වෙනත් යම් ගාස්තු හා අයකිරීම් ණය ගැණුම්කරුවගේ /කරුවන්ගේ ගිණුමෙන් හර කෙරෙනු ඇති බවට, ඒවා ගිණුම් ප්‍රකාශනයෙහි දැක්වෙනු ඇති අතර බැංකුවේ ගාස්තු ලේඛනයෙහි නිශ්චිතව දක්වනු ඇති බවට ණය ගැණුම්කරු/කරුවන් එකඟ වේ. නියමිත කාලයට පෙර ආපසු ගෙවීම / අර්ධ වශයෙන් ගෙවීම් කලින් කලට බැංකුව විසින් සිය අභිමතය පරිදි තීරණය කරනු ඇති ගාස්තුවක් මත භාර ගැනෙනු ඇත.

10. කලින් කලට හඳුන්වා දෙනු ලබන හෝ සංශෝධනය කරනු ලබන ගාස්තු සහ අයකිරීම් ණය ගැණුම්කරුගේ/ණය ගැණුම්කරුවන්ගේ ගිණුමට හර කරනු ලැබිය හැකි බවට සහ ගිණුම් ප්‍රකාශනයෙහි දැක්වෙනු ඇති බවට සහ බැංකුවේ ගාස්තු ලේඛනයෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි බවට ණය ගැණුම්කරු/ණය ගැණුම්කරුවන් එකඟ වෙයි.

11. බැංකුවෙහි භාරයේ හෝ පාලනයෙහි පවතින ණය ගැණුම්කරු /කරුවන් හට අයත් දේපල, අයිතිවාසිකම් හා පොලී මත බැංකුවට ලියමක් හෝ පියවා ගැනීමේ අයිතියක් (හෝ ඊට සමාන අයිතියක්) පවතින බවට ණය ගැණුම්කරු /කරුවන් වැඩිදුරටත් එකඟ වී සිටින අතර, බැංකුව විසින් එම අයිතීන් ක්‍රියාවෙහි යෙදවිය හැකි අතර, බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දී පූර්ව දැනුම්දීමකින් තොරව ණය ගැණුම්කරු /කරුවන්ගේ නමින්/නම් වලින් පවතින ඕනෑම ගිණුමක් හෝ ගිණුම් සියල්ල ඒවා කවර ශීර්ෂයක් යටතේ පැවතිය ද ඒ බව නොතකා සම්බන්ධකර ඒකාබද්ධ කිරීම සහ/හෝ ජංගම ගිණුමක් හෝ ඉතුරුම් ගිණුමක් හෝ කාල තැන්පතු ගිණුමක් වුවද බැංකුවේ කිසියම් ශාඛාවක දී ණය ගැණුම්කරු /කරුවන්ගේ ගිණුමට යම් අවස්ථාවක දී බැංකුව විසින් නියම කර ඇති කවර මුදල් වර්ගයකින් පැවතිය ද, එම මුදල් සියල්ලම හෝ කිසියම් මුදලක් යොදවා අයිරා වී ඇති යම් ගිණුමක් එමඟින් පියවීම කළ හැකිය.

12.(i)මෙම අත්තිකාරමෙහි කොන්දේසියක් වන්නේ ණය ගැණුම්කරු /කරුවන් විසින් අවසරලත් සීමාව ඉක්මවන්නේ නම් හෝ ණය වාරිකය පියවීමට අසමත් වන්නේ නම්, බැංකුව විසින් ණය ගැණුම්කරු /කරුවන්ගේ ස්ථාවර තැන්පතුව (තැන්පතු) බැර ශේෂයන් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් ඉවත් කරගැනීම / හර කිරීම සහ, පහත 12(iii) වගන්තියෙහි දක්වා ඇති පරිදි, අනුයෝජන අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම පිණිස, සිය තනි අභිමතය මත ණය ගැණුම්කරු /කරුවන් වෙත පූර්ව දැනුම්දීමකින් තොරව පහසුකම අඩුකිරීම හෝ අවලංගු කිරීම සිදු කළ හැකි බව ණය ගැණුම්කරු /කරුවන් අවබෝධ කරගෙන එකඟ වී සිටියි. එවැනි අවස්ථාවක දී ණය ගැණුම්කරු / කරුවන්ගේ උපදෙස් මත කල් පිරීමට පෙර කාල තැන්පතුව ආපසු ලබාගත්තාක් මෙන් කාල තැන්පතු ගිණුම් වලට අදාළ වන නීතිරීති හා කොන්දේසි වලට අනුව දඩුවම් ගාස්තු අදාළ වනු ඇත.

(ii) හිඟව පවතින සහ ණය ගැණුම්කරු / කරුවන් විසින් බැංකුව වෙත ගෙවිය යුතු මුදල සම්බන්ධව බැංකුවෙහි නිලධාරියෙකු විසින් ලබාදෙන සහතිකයක්, පහසුකම් යටතේ හිඟව පවතින සහ ණය ගැණුම්කරු /කරුවන් විසින් ගෙවිය යුතුව පවතින සත්‍ය මුදල සම්බන්ධයෙන් සියලුම අරමුණු සඳහා ප්‍රමාණවත් හා අවසානාත්මක සාක්ෂියක් වනු ඇත.

(iii) බැංකුව වෙත ඇති මෙම අධිකාරී බලය අවලංගු කළ නොහැකි බවට ද බැංකුවෙහි කැමැත්ත සහිතව අවලංගු කරන තෙක් පූර්ණ වශයෙන් බලාත්මකව පවතිනු ඇති බවට ද ණය ගැණුම්කරු / කරුවන් මෙමඟින් ප්‍රකාශ කර සිටිති. මීට පටහැනිව යම් ලිඛිත හෝ වෙනත් නීතියක හෝ ගිවිසුමක හෝ මින් අනතුරුව ණය ගැණුම්කරු / කරුවන් විසින් හෝ බැංකුව විසින් හෝ සකස් කළ හෝ සකස් කරනු ඇති ලියැවිල්ලක කිසිවක් සඳහන්ව තිබුණ ද ඒ බව නොතකා, ණය ගැණුම්කරු / කරුවන් වෙත පූර්ව දැණුම්දීමක් නොකර සහ හිඟව පවතින මුදල් බැංකුවට ගෙවන ලෙස ණය ගැණුම්කරු / කරුවන් වෙතින් කිසිදු පූර්ව ඉල්ලා සිටීමක් නොමැතිව බැංකුවට ඕනෑම අවස්ථාවක දී සහ සියලුම අවස්ථාවල දී අත්පත් කරගැනීමේ අයිතිවාසිකම ක්‍රියාවේ යෙදවීමට බලය හා අවසරය පවතිනු ඇත.

(iv) මේ යටතේ කිසියම් පියවීමේ හෝ ලිපියක් හෝ අත්පත් කරගැනීමේ අයිතියක් ක්‍රියාවේ යෙදවීමේ දී හෝ එමඟින් හෝ වෙනත් ආකාරයකින් යම් චෙක්පතක් හෝ මුදල් ගෙවීම සඳහා වන එවැනි වෙනත් ලේඛනයක් හෝ අණකරයක් ගරු කිරීමට බැංකුව විසින් ක්‍රියා කිරීම හෝ උද්දේශිතව ක්‍රියා කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස හෝ ඊට සම්බන්ධ කළ හැකි ඕනෑම ආකාරයක හෝ ස්වභාවයක අයැදීම්, හානි, පාඩු, පිරිවැය සහ වියදම් සහ ඕනෑම ආකාරයක අගතියකින් බැංකුව හානිපූරණය කිරීමට ද බැංකුවට හානි සිදුවීම වැළැක්වීමට ද ණය ගැණුම්කරු / කරුවන් මෙමඟින් වැඩිදුරටත් භාරගනිති.

13. ණය ගැණුම්කරු / කරුවන් හට හිඟව පවතින පහසුකම් කිහිපයක් ඇති විට ඔහුගේ/ඇයගේ ඉතුරුම් / ජංගම ගිණුම්වලින් කිසිවකට බැර කරන ලද කිසියම් මුදලක් බැංකුව විසින් අවශ්‍ය යැයි සලකන ආකාරයකට අයකර ගැනීමට ණය ගැණුම්කරු / කරුවන් මෙමඟින් බැංකුව වෙත අවසර දී සිටින අතර, එවැනි අයකරගැනීමක් සම්බන්ධව හබ කිරීමට ණය ගැණුම්කරු විසින් කිසිදු අයැදීමක් නොකළ යුතුය.

14. හිඟ මුදල් අයකර ගැනීම සඳහා තුන්වන පාර්ශ්වයක එකතු කිරීමේ නියෝජිතයන් පත්කර ගැනීම සඳහා ණය ගැණුම්කරු/ණය ගැණුම්කරුවන් විසින් මෙයින් එකඟවී බැංකුවට අවසර දෙනු ලැබේ. ගෙවීම බලාත්මක කරවා ගැනීම සඳහා නෛතික පියවර ගැනීමට හෝ අවශ්‍ය වුවහොත් පොලිය සමඟ හිඟ මුදල් එකතු කිරීම සඳහා දරන ලද සියලු පිරිවැය ණය ගැණුම්කරු/ණය ගැණුම්කරුවන් විසින් ගෙවනු ලැබිය යුතුය.

15. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට (CRIB) සහ/හෝ දේශීය හෝ විදේශීය වෙනත් යම් ණය තොරතුරු කාර්යාංශයකට ණය ගැණුම්කරු / කරුවන්ගේ ණය පැවැත්ම සම්බන්ධයෙන් සිය අභිමතය පරිදි වාර්තා කිරීමට බැංකුවට හිමිකම් පවතින බවට ණය ගැණුම්කරු/කරුවන් මෙමඟින් අවසර දී පිළිගනියි. මේ යටතේ පවතින යම් අයිතියක් හෝ ප්‍රතිකර්මයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ බලාත්මක කිරීමේ දී (සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් පමණක් වුවද) බැංකුව වෙතින් සිදුවන ප්‍රමාදයක් හෝ නොකර හැරීමක් එවැනි අයිතියක් හෝ ප්‍රතිකර්මයක් අතහැරීමක් ලෙස අර්ථනිරූපනය නොකළ යුතුය.

16. මෙම පහසුකම සඳහා උකස් තබා ඇති කාල තැන්පතු කල්පිරීමේ දී හෝ කල්පිරීමට පෙර අර්ධ වශයෙන් ගෙවීම් සඳහා බැංකුව විසින් අවසර ලබා දෙනු ඇත්තේ ඉතිරි කාල තැන්පතු, අවස්ථාවෝචිතව, ජංගම ගිණුමෙහි හෝ ණය ගිණුමෙහි පවතින හිඟ මුදල ආවරණය කිරීමට ප්‍රමාණවත් වන්නේ නම් පමණක් බවට ණය ගැණුම්කරු/කරුවන් පිළිගනියි.

17. ණයකරුගේ හවුල් දේශීය / විදේශ මුදල් කාලීන තැන්පතු, ණයගැණුම්කරුගේ ජංගම ගිණුමට සම්බන්ධ කෙරෙනු ඇත්තේ බැංකුව වෙත ලබා දී ඇති මැන්ඩේට් පත්‍රයේ ඇති උපදෙස් මඟින් දෙපාර්ශ්වයෙන් ඕනෑම පාර්ශ්වයකට අයිරා පහසුකමක් ඉල්ලා සිටිය හැකි බවට සඳහන් ව ඇත්නම් පමණක් බවට ණය ගැණුම්කරු / කරුවන් එකඟ වී සිටියි.

18. බැංකුව වෙතින් ලැබෙන සියලුම ගිණුම් ප්‍රකාශන ප්‍රවේශමෙන් පරීක්ෂා කිරීමට ණය ගැණුම්කරු /කරුවන් භාර ගනියි. බැංකුවේ වාර්තා වල දැක්වෙන පරිදි ණය ගැණුම්කරු /කරුවන්ගේ ලිපිනයට ගිණුම් ප්‍රකාශනය යවන ලද දිනයේ සිට එක් මාසයක් ඇතුළත දී ණය ගැණුම්කරු /කරුවන් වෙතින් කිසිදු විරෝධතාවක් ලැබී නොමැති නම්, එහි දක්වා ඇති

ශේෂය නිවැරදි බවට සලකනු ඇති අතර, ණය ගැණුම්කරු /කරුවන් වෙතින් කිසිදු සන්නිවේදනයක් ලැබී නොමැති බව, ගිණුමේ නිවැරදි භාවය තහවුරු කිරීමක් ලෙසට අර්ථකරණය කෙරෙනු ඇති අතර, එවැනි ගිණුම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් ණය ගැණුම්කරු /කරුවන් හට කිසිදු විරෝධතාවක් මතු කළ නොහැකි වේ. කිසියම් කාලසීමාවක් සඳහා ණය ගැණුම්කරු /කරුවන් හට ගිණුම් ප්‍රකාශනයක් නොලැබුණේ නම්, බැංකුව වෙතින් ප්‍රකාශනයක් ඉල්ලා සිටීම ණය ගැණුම්කරු /කරුවන්ගේ තනි සහ පූර්ණ වගකීමක් බව ණය ගැණුම්කරු /කරුවන් පිළිගනියි.

19. බැංකුව විසින් යම් අවස්ථාවක දී ඉල්ලා සිටින්නේ නම්, ණයගැණුම්කරු/කරුවන් විසින් බැංකුව වෙත උකස් සුරක්ෂිතයක් තැබිය යුතු අතර, දැන් හෝ අනාගතයේ දී ණය ගැණුම්කරු / කරුවන්ගේ නමින් පවතිනු ඇති සියලුම මුදල්, හා වෙනත් වටිනා ලේඛන බැංකුවෙහි නියමය මත බැංකුවෙහි තැන්පත් කරනු ඇත. ණයගැණුම්කරු /කරුවන් විසින් මෙකී පහසුකම් යටතේ හෝ වෙනත් බැංකු පහසුකම් යටතේ පොලී, ගාස්තු හා වියදම් ද ඇතුළත්ව බැංකුව වෙත ණය ව සිටින සමස්ත මුදල පියවීම සඳහා වන සුරක්ෂිතයක් ලෙස මේවා සැලකීමට, සාධාරණය ක්‍රියා කරන බැංකුව හිමිකම් ලබයි.

20. මේ යටතේ පවතින යම් අයිතියක් හෝ ප්‍රතිකර්මයක් ක්‍රියාත්මක කිරීමේ දී හෝ බලාත්මක කිරීමේදී (සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන්) බැංකුව වෙතින් සිදුවන ප්‍රමාදයක් හෝ නොකර හැරීමක් එවැනි අයිතියක් හෝ ප්‍රතිකර්මයක් අතහැරීමක් ලෙස අර්ථනිරූපනය නොකළ යුතුය.

21. ණය ගැණුම්කරුවන් දෙදෙනෙකුට හෝ වැඩි දෙනෙකුට ණය පහසුකම් ප්‍රදානය කරමින් පැවතිය දී හෝ ප්‍රදානය කිරීම අඛණ්ඩව සිදුවන අවස්ථාවකදී හෝ බැංකුව වෙත අයවිය යුතු සියලු මුදල් සම්බන්ධයෙන් එක්ව හා වෙන් වෙන්ව ඔවුන් වගකීමට බැඳී සිටීමට භාර ගනියි.

22. රඳවා ගැනීමක් සිදුකිරීමට ණය ගැණුම්කරු /කරුවන් වෙත නීතියෙන් බලකිරීමක් පවතින්නේ නම් හැර, ණය ගැණුම්කරු /කරුවන් විසින් ගෙවන ගෙවීම් කිසිදු පියවීමක්, ප්‍රති හිමිකම් පෑමක්, රඳවා ගැනීමක් හෝ කිසිදු ආකාරයක කොන්දේසියකින් තොරව ගෙවිය යුතු වේ. බැංකුව වෙත සත්‍ය වශයෙන් ම ලැබෙන මුදල එවැනි රඳවාගැනීමක් නොතිබූයේ නම් ලැබෙන මුදල වන ආකාරයට ණය ගැණුම්කරු /කරුවන් විසින් ගෙවිය යුතුව පවතින මුදල ඉහළ දැමිය යුතු වේ.

23. කිසිදු නිශ්චිත හේතු දැක්වීමකින් තොරව පහසුකමක්/පහසුකම් සඳහා වන ඕනෑම අයැදුමක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනියි.

24. ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත හෝ ලැයිස්තුගත ව නොමැති ඕනෑම ආයතනයකින් සියයට 10 ක (10%) හෝ ඊට වැඩි ප්‍රතිශතයක කොටස් ප්‍රමාණයක් ණය ගැණුම්කරු /කරුවන් විසින් තමා සතු කරගත් විටක දී සහ/හෝ අත්පත් කරගත් විටක දී ණය ගැණුම්කරු/කරුවන් විසින් ඒ පිළිබඳව වහාම ලිඛිතව බැංකුව දැනුවත් කරනු ඇත.

25. මෙම නීතිරීති සහ කොන්දේසිවලට අදාළව යම් නියමයක් හෝ කොන්දේසියක් එකතු කිරීම, වෙනස් කිරීම, සහ ඉවත් කිරීම සඳහා වූ අයිතිය බැංකුව වෙත රඳවා තබා ගනු ලැබේ. මෙකී නීතිරීති සහ කොන්දේසිවලට එසේ සිදුකරනු ලබන වෙනස්කිරීම් ලිපියක් මගින්, සහ/හෝ ගිණුමට අදාළ ප්‍රකාශන පණිවුඩයක් මගින්, සහ/හෝ බැංකු ශාඛා කාර්යාල වල දැන්වීම් පුවරු වල ප්‍රදර්ශනය කිරීම මගින්, සහ/හෝ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.hsbc.lk හි ප්‍රදර්ශනය කිරීම මගින්, සහ/හෝ බැංකුවට සුදුසු යැයි හැඟෙන ඕනෑම ඉලෙක්ට්‍රොනික/ඩිජිටල් සන්නිවේදන ක්‍රමවේදයක් හරහා හෝ ණය ගැණුම්කරුට/ණය ගැණුම්කරුවන්ට දැණුම් දෙනු ලබන අතර, ණය ගැණුම්කරු/කරුවන් එමගින් බැඳී සිටිනු ඇත.

26. පහසුකම/පහසුකම් යටතේ වන අයිතීන්, ප්‍රතිලාභ සහ/හෝ වගකීම් සියල්ලම හෝ යම් කොටසක් හෝ ණය, සුරැකුම්පත්, හෝ වෙනත් මූල්‍ය වත්කම් සැකසීම, මිලදී ගැනීම හෝ ආයෝජනය කිරීම පිණිස විධිමත් ලෙස සම්බන්ධ වී සිටින හෝ ස්ථාපිත කරන ලද, බැංකුවෙහි ඕනෑම සමූහ කාර්යාලයකට, වෙනත් බැංකුවකට හෝ මූල්‍ය ආයතනයකට හෝ වෙනත් ආයතනයකට අනුයුක්ත කිරීම හෝ පැවරීම හෝ මා හට ලිඛිත දැනුම්දීමකින් යුතුව, බැංකුව විසින් සිදු කළ හැකි බවට මම එකඟ වෙමි. එවැනි අනුයුක්ත කිරීමක් හෝ පැවරීමක් දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති බලාත්මක වන දින සිට ක්‍රියාත්මක වනු ඇති අතර, දැන්වීමෙහි දක්වා ඇති පරිදි අනුයුක්ත කළ අය / පැවරුම්ලාභියා විසින් භාර ගත් බවට උපකල්පනය කිරීමෙන් අනතුරුව, බැංකුව එවැනි අයිතීන්, ප්‍රතිලාභ සහ/හෝ වගකීම් වලින් නිදහස් වනු ඇත. මෙම කාඩ්පත් ගිණුමෙහි කිසිදු අයිතියක්, ප්‍රතිලාභයක් හෝ බැඳීමක් කිසිදු ලෙසකින් අනුයුක්ත කිරීම හෝ පැවරීම හෝ මා විසින් සිදු නොකළ යුතුය

27. මෙම නීතිරීති හා කොන්දේසි ශ්‍රී ලංකාවෙහි නීතිවලට අනුව බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු අතර, නඩු කටයුතු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි අධිකරණවලට ඉදිරිපත් කළ යුතු වන නමුත්, බැංකුව විසින් සුදුසු යැයි තීරණය කරනු ලබන්නේ නම්, නඩු කටයුතු ශ්‍රී ලංකාවේ වෙනත් යම් අධිකරණයක් හෝ වෙනත් යම් රටක හෝ අධිකරණ කලාපයක වෙනත් ඕනෑම අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවක දී එකී අධිකරණවලට අදාළ වන නීතිය අදාළ කරගනු ලැබිය යුතු අතර, එවැනි වෙනත් යම් අධිකරණ සඳහා සහ වෙනත් යම් නෛතික ආයතන සඳහා දරන ලද නෛතික පිරිවැය අධිකරණ ගාස්තු, සහ නීතිඥ ගාස්තු ණයගැතිභාවය සඳහා එකතු කරනු ලැබිය යුතු බවට ණය ගැණුම්කරු/කරුවන් එකඟ වේ. ණය ගැණුම්කරු/ණය ගැණුම්කරුවන් විසින් අයවිය යුතු සියලු මුදල් සම්බන්ධයෙන් එක්ව හා වෙන් වෙන්ව වගකීමට බැඳී සිටිති.

28. විදේශ විනිමය සම්බන්ධයෙන් වර්තමානයේ බලපැවැත්වෙන හා කලින් කලට සංශෝධනය කෙරෙනු ඇති නීතිරීති ද ඇතුළුව නමුත්, ඊට සීමා නොවී, ශ්‍රී ලංකාවේ නීතිරීති සහ රෙගුලාසි වලින් බැඳී සිටීමට ණය ගැණුම්කරු/කරුවන් එකඟ එකඟව භාරගනියි.

29. බැංකුව සමග පවත්වාගෙන යනු ලබන ණය ගැණුම්කරු/කරුවන්ගේ ගිණුම/ සියලු ගිණුම් වල තැන්පත් කරන ලද වත්කම් සහ/හෝ මුදල් සම්බන්ධයෙන් මෙන්ම, එකී වත්කම් සහ/හෝ මුදල් මගින් උත්පාදනය කරනු ලබන ආදායම් සහ ලැබීම් සම්බන්ධයෙන්, කලින් කලට පවත්නා අදාළ නීතිරීති සහ රෙගුලාසි අනුව අවශ්‍ය කෙරෙන ආකාරයට, අදාළ සියලු බලධාරී

බදු අධිකාරීන් වෙත ණය ගැනුම්කරු/කරුවන් විසින් වාර්තා කර ඇති බව සහ ඉදිරියට ද වාර්තා කරනු ලබන බවට මෙන්ම ණය ගැනුම්කරු/කරුවන් විසින් තහවුරු කරයි.

**තොරතුරු හෙළිදරව් කිරීම**

30. බැංකුව විසින් පත් කරන ලද ඕනෑම තෙවැනි පාර්ශ්වයේ සේවාසපයන්නකු වෙත හෝ HSBC සමූහයේ ඕනෑම කාර්යාලයකට, පහසුකම/පහසුකම් සම්බන්ධයෙන් යම් ලැදියාවක් ලබන හෝ අවදානමක් භාර ගනු ලබන ඕනෑම පාර්ශ්වයක් වෙත, රජයේ ආයතන සහ/හෝ නියාමකයන් වෙත බැංකුවට සුදුසු යැයි හැඟෙන පරිදි, ණය ගැණුම්කරු/කරුවන් පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම සඳහා ණය ගැණුම්කරු/කරුවන් විසින් බැංකුව වෙත බලය පවරයි. බැංකුව සමඟ තවදුරටත් ණය ගැණුම්කරු/කරුවන් විසින් පහසුකම/පහසුකම් පවත්වාගෙන නොයන අවස්ථාවන් හි දී ද මෙකී බලය ලබාදීම බලාත්මක වේ

**B කොටස - අයිරා පහසුකම සඳහා අදාළ වේ.**

1. කිසියම් ගෙවුම් නියමයකට ගරු කළහොත් එමගින් අවසරලත් සීමාව (සීමාවන්) ඉක්මවා යාමක් සිදුවීමට හැකි නම් එයට ගරු කිරීමට බැංකුව විසින් ප්‍රතික්ෂේප කළ හැකිය. එවැනි ගෙවුම් නියමයක් ප්‍රතික්ෂේප කර ඇති බව ණය ගැණුම්කරු /කරුවන් වෙත දැනුම්දීමට බැංකුව වෙත කිසිදු බැඳීමක් නොපවතී. බැංකුව විසින් හෝ එහි කිසියම් නිලධාරියෙකු විසින් පිරිනමා ඇති කිසිදු දීර්ඝ කිරීමක්, අයිතීන් අතහැරීමක් හෝ අනුග්‍රහයක් හේතුවෙන් මේ යටතේ බැංකුවට ඇති අයිතීන්ට අගතියක් සිදු නොවනු ඇත. අවසරලත් සීමාව ඉක්මවා ගිය අවස්ථාවක දී යම් අතිරික්තයක් මෙම නීතිරීති හා කොන්දේසිවලට යටත් වන බවට ණය ගැණුම්කරු /කරුවන් පිළිගනියි.

2. බැංකුවේ දී ගෙවිය යුතු ලෙස නියම කළ අයිතමයක් ද ඇතුළත්ව බැංකුව විසින් ණය ගැණුම්කරු /කරුවන්ගේ ගිණුම (ගිණුම්) වෙත බැර කරන යම් අයිතමයක් සාමාන්‍ය නාලිකා ඔස්සේ නිශ්කාශනයට යටත් වන බවට ණය ගැණුම්කරු /කරුවන් එකඟ වේ. අයිරා පොලිය ගණනය කිරීමේ දී එසේ බැර කරන ලද එම අයිතම නිශ්කාශනය කෙරෙන තෙක් එම අයිතමවල වටිනාකම බැහැර කිරීමට බැංකුවට අයිතිය පවතී.

3. විදේශ මුදල් කාල තැන්පතුවක් මත පවතින ස්මාට් මනී පහසුකමක් සම්බන්ධයෙන් අදාළ විදේශ මුදල් වර්ගයේ විනිමය අනුපාත වෙනස්වන සෑම අවස්ථාවක දී ම අයිරා සීමාව වෙනස්වීමට යටත් වන බවට ණය ගැණුම්කරු / කරුවන් මෙමඟින් එකඟ වෙති. එසේම, තැන්පතු කල්පිරීමේ දී ගෙවන ලද පොලී (ඇත්නම්) ඒවා නැවත ආයෝජනය නිසා තැන්පතුවල වැඩිවීම්, සලකා බලා තැන්පතුවල සෑම කල්පිරීමක දී ම අයිරා සීමාව ස්වයංක්‍රීයව ම සැකසෙනු ඇත.

4. ස්මාට් මනී අයිරා පහසුකමෙහි අයිරා ශේෂය විදේශ මුදල් තැන්පතු මගින් සුරක්ෂිත කර ඇත්නම්, සහ විනිමය අනුපාතිකයේ අහිතකර වෙනසක් හේතුවෙන්, ලබා දී ඇති ණය සීමාව අඩු කළ හැකි අතර, එවැනි අතිරික්තයක් පිළිබඳ දැනුම්දීමක් ලැබුණු වහාම එකී අතිරික්තය ආපසු ගෙවීමට හෝ එවැනි අතිරික්තයක් ආවරණය කිරීමට ප්‍රමාණවත් තැන්පතුවක්/තැන්පතු සැපයීමට ණය ගැණුම්කරු/කරුවන් භාර ගනියි.

5. ස්මාට් මනී අයිරා පහසුකම් මත පොලී අය කරනු ලබන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්ති අනුපාතිකයන් සහ/හෝ භාණ්ඩාගාරික බිල්පත් (TB) පොලී අනුපාතික සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද පොලී අනුපාතික මත පදනම් ව වන අතර, බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි, කලින් කලට ඒවා වෙනස්විය හැකිය.

6. අයිරා පහසුකමෙහි පොලිය සහ මූලික මුදල ව්‍යවස්ථාපිත හිඟ මුදල් ද සමඟ ඉහතින් නිශ්චිතව දක්වා ඇති ණය ගැණුම්කරු / කරුවන්ගේ ජංගම ගිණුමෙන් හර කර අයකෙරෙනු ඇත. ණය ගැණුම්කරුගේ/කරුවන්ගේ නමින් අයිරා බවට පත්වූ යම් ගිණුමක් සම්බන්ධයෙන් බැංකුව විසින් එසේ හිඟව පවත්නා මුදල් සඳහා දෛනික ශේෂය මත පදනම්ව හෝ ඉහත 24 වන වගන්තියේ සඳහන් ආකාරයට උපදෙස් ලබා දී ඇති පරිදි, බැංකුව විසින් තීරණය කරනු ලබන යම් අනුපාතයක් මත පොලිය අය කරනු ලැබිය හැකිය.

**C කොටස - ස්මාට් මනී පහසුකම් ණය සඳහා අදාළ වේ.**

1. ස්මාට් මනී පහසුකම් ණය මුදල සම්බන්ධයෙන් ආපසු ගෙවීමේ සම්පූර්ණ කාලසීමාව (උපරිම අවුරුදු 3යි) සඳහා අදාළ වන්නේ ස්ථාවර පොලී අනුපාතිකයකි.

2. බැංකුව විසින් සාමාන්‍ය ආකාරයට ගණනය කරනු ලබන පොලිය සෑම එක් එක් මාසයේදීම හෝ බැංකුව විසින්තීරණය කරනු ලබන කාලාන්තරයන් තුළදී ණය ගැණුම්කරුගේ/ කරුවන්ගේ ගිණුමට බැංකුව විසින් බැර කරනු ලැබිය හැකිය. මෙකී පහසුකම් සම්බන්ධයෙන් හෝ ණය ගැණුම්කරුට /කරුවන්ට ලබාදෙන ලද වෙනත් යම් ණය පහසුකමක් හෝ යම් ලිඛිත නියමයක් හෝ එසේ නොමැතිව ණය ගැනුම්කරු/ණය ගැණුම්කරුවන් වෙනුවෙන් කරන ලද නියමයක් සම්බන්ධයෙන් අයවිය යුතු හෝ දරන ලද යම් කොමිස් මුදලක්, වියදම් හෝ ගාස්තු, ණය ගැණුම්කරුගේ/ණය ගැණුම්කරුවන්ගේ බැංකු ගිණුමට බැර කරනු ලැබිය හැකිය.

3. ණය වාරික එක් එක් මාසයේ නියම කර ඇති නියමිත දිනයේ දී ගෙවනු ලැබිය යුතු අතර, ණය ගෙවිය යුතු බවට නියම කර ඇති නියමිත දිනයේ දී ණය වාරිකය ද සමග ඉල්ලුම්පතෙහි නිශ්චිතව දැක්වන ණය ආපසු ගෙවීමේ ගිණුමට ණය ආපසු ගෙවීම හර කිරීමට ණය ගැණුම්කරු/කරුවන් විසින් බැංකුවට බලය පවරනු ලැබේ.



PUBLIC

4. එවැනි ආපසු ගෙවිය යුතු දිනයක දී නිෂ්කාශනය වූ අරමුදල් නොමැති අවස්ථාවකදී ගිණුමේ බැරට ඇති යම් මුදල්, එක හිඟ වාරිකය/වාරික සහ පැහැර හරින ලද පොලියට එරෙහිව උපචිත කරගෙන අදාළ කරගනිමින් ඊළඟ මාසයේ ගෙවීම් කළ යුතු දිනයේ දී ආවරණය කරගැනීම හෝ එම හිඟ වාරික ආවරණය වන පරිදි ප්‍රමාණවත් අරමුදල් ගිණුමේ ඇති අවස්ථාවේ දී අදාළ කරගනු ලැබීම කරනු ලැබිය හැකිය. හිඟ ණය වාරිකය/වාරික සහ පොලිය මත පැහැර හැරීමේ පොලිය අදාළ වනු ඇත.

5. ස්මාට් මනී පහසුකම් ණය යටතේ ලබා දී ඇති ණය පහසුකම් සම්බන්ධයෙන් පැහැර හැරීම් සිදුවන අවස්ථා පහත පරිදි වේ:
   a. බැංකුව විසින් තීරණය කරනු ලබන පරිදි, නිශ්චිත මාසයක් සඳහා ගෙවීමට නියමිත මූලික හෝ පොලිය හෝ වාරිකය සඳහා වන ආපසු ගෙවීමක් කිසියම් එක් මාසයක දී නොගෙවීම
   සහ/හෝ;
   b. බංකොලොත් භාවය / වස්තු භංගත්වය.

**වෙනත් කොන්දේසි**

බැංකුව විසින් අයිරාවක හෝ වාරික ණය මුදලක ස්මාට් මනී පහසුකමක් ණය ගැණුම්කරු /කරුවන් වෙත පිරිනැමීමට හෝ අඛණ්ඩව පවත්වාගෙන යාම සලකා බලා;

1. ණය ගැණුම්කරු /කරුවන්ගේ ඉල්ලීම මත ස්මාට් මනී පහසුකම යටගේ ණය ගැණුම්කරු / කරුවන් විසින් අනාගතයේ දී විවෘත කරනු ලබන ඕනෑම කාල තැන්පතුවක්, ණය ගැනුම්කරු /කරුවන්ගේ පාර්ශ්වයෙන් තවදුරටත් එකඟතාවකින් තොරව, බැංකුව වෙත ඇපයට තබා ඇති බවට සැලකෙනු ඇති බවට සහ මෙම පහසුකම් වල අරමුණ වෙනුවෙන් 'කාල තැන්පතුව (තැන්පතු) යන නියමයට එවැනි කාල තැන්පතු අලුත් කිරීම සහ/හෝ එවැනි කාල තැන්පතු ආපසු ලබාගත හොත් හෝ ප්‍රතිස්ථාපනය කළහොත් නව කාල තැන්පතු ද ඇතුළත් වන බවට ණය ගැනුම්කරු / කරුවන් එකඟ වේ.
2. ඉහත "උකස් සුරක්ෂිත තොරතුරු"** කොටසෙහි නිශ්චිතව දක්වා ඇති කාල තැන්පතුව /තැන්පතු කල් පිරීමට පෙරාතුව හෝ එකී කාල තැන්පතුව /තැන්පතු කල් පිරීමේ දී ආපසු ලබා ගැනීම / ඉවත් කරගැනීම සිදු කර, ඉන් ලත් මුදල් නව කාල තැන්පතුවක /තැන්පතු වල ප්‍රති ආයෝජනය කරනු ලැබුවහොත්, එකී කාල තැන්පතුව කිනම් ගිණුම් අංකයක් යටතේ වැටුණද, ඒ බව නොසලකා, එවැනි නව කාල තැන්පතුව /තැන්පතු සියල්ලම, උකස් සුරක්ෂිත වශයෙන් අඛණ්ඩව රඳවා තබා ගනු ඇත.
3. කල්පිරීමට පෙර ණය ගැණුම්කරු /කරුවන් විසින් පටහැනිව උපදෙසක් බැංකුව වෙත ලැබුණහොත් හැර, පෙර හා සමාන කාලසීමාවක් සඳහා නියමිත දිනයන් හි දී තැන්පතු ස්වයංක්‍රීයව අලුත් කිරීමට ණය ගැණුම්කරු /කරුවන් විසින් බැංකුව වෙත අවසර ලබා දේ.

4. දේශීය ආදායම් දෙපර්තමේන්තුව හෝ වෙනත් යම් නියාමන අධිකාරියක් හෝ නියාමන නොවන අධිකාරියක් විසින් තැන්පතු සම්බන්ධව කරන යම් අයැදීමක් බැංකුව විසින් තැන්පතු සුරක්ෂිතයක් ලෙස රඳවා සිටීමේ අත්තිකාරමෙහි ප්‍රමාණය දක්වා ද්විතීයික මට්ටමෙහි ලා සැලකෙනු ඇති බවට ණය ගැණුම්කරු /කරුවන් පිළිගනියි.

5. ස්මාට් මනී පහසුකම ලබාගැනීමට සැලැස්වෙනු ඇත්තේ අභ්‍යන්තර බැර තහවුරු කරගැනීම සිදුවූ පසුව පමණක් බවට ණය ගැණුම්කරු /කරුවන් පිළිගනියි.

6. කිසිදු හේතුවක් නොදක්වා සිය තනි අභිමතය පරිදි ස්මාට් මනී අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට අයිතිය ඇති බව ණය ගැණුම්කරු /කරුවන් පිළිගනියි.

7. පහසුකමට එරෙහිව ඇපයට තබා ඇති ඔහුගේ / ඇයගේ / ඔවුන්ගේ කාල තැන්පතුව (තැන්පතු), බැංකුව විසින් කල්පිරීම මත, කල්පිරීමට පෙර ඉවත් කරගතහොත් හෝ හිලව් කරනු ලැබුවහොත්, ස්මාට් මනී පහසුකම ස්වයංක්‍රීයව අවලංගු වන බවට ණය ගැණුම්කරු /කරුවන් එකඟ වේ.

8. ස්මාට් මනී පහසුකමක සමස්ත හිඟ මුදල පියවීමට විදේශ මුදල් කාල තැන්පතු බැංකුව විසින් ඉවත් කරගනු ලැබුවහොත්, විනිමය පාලන රෙගුලාසි මඟින් පාලනය වන බැංකුව විසින් ඉවත් කරගනු ලැබූ කාල තැන්පතු පසු දිනක නැවත විදේශ මුදල් බවට හැරවීමක් නොකරන බවට ණය ගැණුම්කරු /කරුවන් පිළිගනියි.

**කාඩ්පත් හිමියාගේ තෘප්තිමත් භාවය පිළිබඳ ප්‍රතිචාරය**

| | |
|---|---|
| **ප්‍රධාන කාර්යාලය** | 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01 |
| **ශාඛා** | |
| බම්බලපිටිය | 123, බෞද්ධාලෝක මාවත, කොළඹ 04 |
| නුගේගොඩ | 171, නාවල පාර, නුගේගොඩ |
| මහනුවර | 27, හරස් වීදිය, මහනුවර |
| පැලවත්ත, | 418, පන්නිපිටිය පාර, පැලවත්ත |
| යුනියන් පෙදෙස | 163, යුනියන් පෙදෙස, කොළඹ 02 |
| මීගමුව | 186, කොළඹ පාර, මීගමුව |
| මොරටුව | 198, ගාලු පාර, ඉඩම, මොරටුව |
| යාපනය | 145, කන්කසන්තුරෙයි පාර, යාපනය |

ඔබ වෙත සේවාවන් සැපයෙන ආකාරය සම්බන්ධයෙන් ඔබ පූර්ණ වශයෙන් සතුටට පත් නොවේ නම්, හෝ අපගේ සැලසුම් මගින් ඔබගේ අපේක්ෂාවන් ඉටු නොවේ නම්, කරුණාකර පහත දැක්වෙන විකල්පයන්ගෙන් එකක් ඔස්සේ වහාම අප අමතන්න.

- අංක **+94 114 511 566** ඔස්සේ පාරිභෝගික විසඳුම් සමග සම්බන්ධ වන්න
- customersolutions@hsbc.com.lk වෙත ඔබගේ ගැටලු යොමු කරන්න
- අප වෙත ලියන්නः කළමනාකරු, පාරිභෝගික අත්දැකීම්, පාරිභෝගික බැංකුකරණ හා වත්කම් හා පුද්ගලික බැංකුකරණ, HSBC, අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

අප වෙත මතු කරන ඕනෑම කරුණක් ඔබ සම්පූර්ණයෙන් සතුටට පත්වන ආකාරයට විසඳීමට අප කැමති වන අතරම, ඔබට මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යාලය වෙත ලිපියක් ලියා ප්‍රතිකර්මයක් ඉල්ලා සිටිය හැකිය. ඔම්බුඩ්ස්මන්වරයාගේ ඇමතුම් තොරතුරු පහත දැක්වේ.

- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් වරයාගේ කාර්යාලය - ශ්‍රී ලංකාව, 143ඒ, වජිර පාර, කොළඹ 5.
- දුරකථනः **94 112 595 625**
- ෆැක්ස්ः **+ 94 112 595 624**
- විද්‍යුත් තැපැලः info@financialombudsman.lk
- වෙබ් අඩවියः www.financialombudsman.lk

වැඩි විස්තර සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන www.hsbc.lk වෙත පිවිසෙන්න.

මෙම නීතිරීති හා කොන්දේසිවල සිංහල සහ දමිළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට ඉංග්‍රිසි භාෂා පාඨය බලපැවැත්විය යුතු බවට මා/අප විසින් මෙයින් සහතික වී එකඟව සිටිමි/සිටිමු.


ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා යනු ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධීක්ෂණය යටතේ වන බලයලත් වාණිජ බැංකුවකි.

ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් - ශ්‍රී ලංකා විසින් නිකුත් කරන ලදී.


**HSBCCSMLOANSMAR2025 (S)**